අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/67/37/06(වා.ස්.මා 2026)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2026.04. 06

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
ජාතික පාසල් විදුහල්පතිවරුන්
අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්
ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්

**<u>අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත්විම් ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් තනතුරුධාරීන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APL/4/AT/Non academic 2026 හා 2026.03.31 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශයෙන් පත්විම් ලද අනධ්‍යයන කාර්ය මණ්ඩල වලට අයත් තනතුරුධාරීන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු විම් 2026.04.07 දින සිට ක්‍රියාත්මක කරන ලෙස දැනුම් දී ඇති බැවින් එපරිදි කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

03. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2026 අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරුධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා වලට අදාළ තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියෙහි සහ මෙම අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණද ඇතුළත් කර යාවත්කාලීන කරන ලද 2026 අනධ්‍යයන කාර්ය මණ්ඩල වාර්ෂික ස්ථාන මාරු ලේඛනය මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි මේ සමඟ පළ කරනු ලැබේ. එම යාවත්කාලීන කරන ලද වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ සඳහන් සියලු ස්ථාන මාරු 2026.04.07 දින සිට ක්‍රියාත්මක විය යුතු බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්.බී. ගන්කේවල
අතිරේක ලේකම්
(අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා)
ලේකම් වෙනුවට

අමාත්‍යතුමිය / அமைச்சர் / Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com